පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

# තෙවන වාර පරීක්ෂණය - 2023

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II

11 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | **(3)** | 11 | **(4)** | 21 | **(2)** | 31 | **(1)** |
| 02 | **(2)** | 12 | **(3)** | 22 | **(4)** | 32 | **(4)** |
| 03 | **(2)** | 13 | **(2)** | 23 | **(3)** | 33 | **(2)** |
| 04 | **(2)** | 14 | **(2)** | 24 | **(3)** | 34 | **(2)** |
| 05 | **(2)** | 15 | **(1)** | 25 | **(1)** | 35 | **(1)** |
| 06 | **(3)** | 16 | **(1)** | 26 | **(1)** | 36 | **(4)** |
| 07 | **(2)** | 17 | **(3)** | 27 | **(4)** | 37 | **(4)** |
| 08 | **(3)** | 18 | **(4)** | 28 | **(2)** | 38 | **(1)** |
| 09 | **(2)** | 19 | **(2)** | 29 | **(3)** | 39 | **(1)** |
| 10 | **(3)** | 20 | **(1)** | 30 | **(3)** | 40 | **(2)** |

**(මුළු ලකුණු 01x40 = 40යි)**

### II කොටස

01. (i) (අ) ප්‍රවාහනය **(ලකුණු 01යි)**
(ආ) ඒක පුද්ගල ව්‍යාපාර **(ලකුණු 01යි)**

(ii) ප්‍රාග්ධනය - ගොඩනැගිලි
ශ්‍රමය - සේවකයින් **(01x2 = ලකුණු 02යි)**

(iii) ඉන්ධන මිල වැඩිවීම.
විනිමය අනුපාත ස්ථාවර නොවීම. **(01x2 = ලකුණු 02යි)**

(iv) (අ) ව්‍යාපාර කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම.
ව්‍යාපාර කළමණාකරණවේදි උපාධියක් තිබීම. **(1/2x2 = ලකුණු 01යි)**
(ආ) එකතු කල අගය මත බදු (VAT) **(ලකුණු 01යි)**

(v) (අ) වත්කම් = හිමිකම් + වගකීම්
800 000 = 500 000 + 300 000 **(ලකුණු 01යි)**

(ආ) මුදල් ගිණුම හර 300 000
බැංකු ණය ගිණුම 300 000
(රු.300 000ක බැංකු ණයක් ලබා ගැනිම) **(ලකුණු 01යි)**

(vi) ණය ගැතියෝ
බඩු තොගය **(01x2 = ලකුණු 02යි)**

(vii) විකුණුම් ජ'නලය ⟶ විකුණුම් ඉන්වොයිසිය **(ලකුණු 02යි)**

(viii) **මුදල් පොත**

| *දිනය* | *විස්තරය* | *වටිනාකම* | *දිනය* | *විස්තරය* | *වටිනාකම* |
|---|---|---|---|---|---|
| 01/01 | ප්‍රාග්ධනය | 500 000 | 01/02 | ගොඩනැගිලි කුලී | 15 000 |
| 01/01 | බැංකු ණය | 300 000 | 01/04 | ගැනුම් | 250 000 |
| 01/12 | විකුණුම් | 120 000 | 01/05 | රක්ෂණ ගාස්තු | 7 000 |
| 01/22 | විකුණුම් | 180 000 | 01/10 | ලිපිද්‍රව්‍ය | 8 000 |
| | | | 01/20 | විදුලි ගාස්තු | 5 000 |
| | | | 01/25 | වැටුප් ගෙවීම් | 40 000 |
| | | | | ශේෂය ප/ගෙ | 775 000 |
| | | **1 100 000** | | | **1 100 000** |

***(ඕනෑම නිවැරදි අයිතම තුනකට ලකුණු 1/2 බැගින් ලකුණු 02යි)***

**මුදල් ශේෂය රු.775 000** **(ලකුණු 02යි)**

(ix) **ආදායම් ප්‍රකාශනය**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | 330 000 | (1/2) |
| (-) විකුණුම් පිරිවැය | | (250 000) | |
| දළ ලාභය | | 80 000 | |
| (-) වියදම් | | | |
| ගොඩනැගිලි කුලී | 15 000 | (1/2) | |
| රක්ෂණ | 7 000 | | |
| ලිපි ද්‍රව්‍ය | 8 000 | | |
| විදුලි ගාස්තු | 5 000 | (1/2) | |
| වැටුප් ගෙවීම් | 40 000 | | |
| දුරකථන ගාස්තු | 6 000 | | |
| බැංකු ණය පොලිය | 2 000 | (1/2) (83 000) | |
| ශුද්ධ අලාභය | | (3 000) | |

ණය පොලිය = $300000 \times \frac{8}{100} \times \frac{1}{12}$

= 2,000

(x) (අ) උපචිත දුරකථන ගාස්තු **(ලකුණු 01යි)**

(ආ) මුළු හිමිකම = 500,000 - 3,000 **(ලකුණු 01යි)**

= 497,000

02. (i) (අ) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරිම හෝ සැපයිම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. **(ලකුණු 01යි)**

(ආ) 1. භාණ්ඩ හා සේවා වල ගුණත්වය ඉහළ නැංවිම
2. රැකියා උත්පාදනය
3. සේවක සුභසාධනය **(1/2x2 = ලකුණු 01යි)**

(ii) (අ) සත්‍ය (ආ) සත්‍ය (ඉ) අසත්‍ය (ඊ) අසත්‍ය
**(1/2x4 = ලකුණු 02යි)**

(iii) 1. ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය
2. සේවක සංඛ්‍යාව
3. භාවිතා කරන බලශක්ති ප්‍රමාණය
4. ව්‍යාපාරයට ඇති වෙළඳපල කොටස **(1/2x4 = ලකුණු 02යි)**

(iv) (අ) 1. අයිතිකරුගේ වගකීම අසීමිත වීම.
2. ප්‍රාග්ධනය රැස්කර ගැනිමේ දුෂ්කරතා පැවතීම.
3. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
4. ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම.
5. අයිතිකරු තනිව ගන්නා තීරණ ඇතැම් විට අසාර්ථක විය හැකි වීම.
**(1/2x2 = ලකුණු 01යි)**

(ආ) 1. පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.
2. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
3. හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම.
4. වගකීම හවුල්කරුවන් අතර බෙදී යාම.
5. සාමුහික තීරණ ගත හැකි වීම. **(1/2x2 = ලකුණු 01යි)**

03. (i) (අ) 1. ප්‍රජාතන්ත්‍රවාදි පාලනයක් පැවතිම.
2. ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය.
3. සාමාජිකයින්ගේ සාමුහික අයිතිය.
4. පොදු අවශ්‍යතා හා අරමුණු වලින් යුක්ත වීම. **(1/2x2 = ලකුණු 01යි)**

(ආ) 1. අත්‍යවශ්‍ය සේවා සම්පාදනය සඳහා උචිත වීම.
2. පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලපෑම් අවම කිරීමට දායක වීම.
3. ලාභය මහජනතාව සතු වීම. **(1/2x2 = ලකුණු 01යි)**

(ii) (අ) සත්‍ය (ආ)අසත්‍ය (අ)සත්‍ය (ආ)අසත්‍ය
**(1/2x4 = ලකුණු 02යි)**

(iii) (අ) 1. එකවර විශාල ප්‍රමාණයක් රැගෙන යා හැකි වීම.
2. පිරිවැය අඩුවීම.
3. ආරක්ෂිත වීම. **(1/2x2 = ලකුණු 01යි)**

(ආ) 1. වේගය වැඩි වීම.
2. මගී සුවපහසුව වැඩි වීම.
3. ජාත්‍යන්තර වෙළඳාම සඳහා පිටුවහලක් වීම. **(1/2x2 = ලකුණු 01යි)**

(iv) 1. ව්‍යාපාරික කටයුතු සඳහා සම්බන්ධ වන විවිධ පාර්ශව අතර තොරතුරු හුවමාරු කරගැනිමට
2. ප්‍රවර්ධන කටයුතු සඳහා
3. සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනිමට. **(1x2 = ලකුණු 02යි)**

04. (i) ව්‍යාපාර අරමුණක් සඵලදායිව ඉටුකර ගැනීම සඳහා පවතින සම්පත් කාර්යක්ෂමව යොදාගනිමින් එම ව්‍යාපාරය සැලසුම් කිරීමට, සංවිධානය කිරීමට මෙහෙයවීමට සහ පාලනය කිරීමට අදාල වු ක්‍රියාවලියකි. **(ලකුණු 02යි)**

(ii) (අ) අසත්‍ය (ආ) අසත්‍ය (අ) අසත්‍ය (ආ) අසත්‍ය
**(1/2x4 = ලකුණු 02යි)**

(iii) (අ) පාසල් සිසුන් **(ලකුණු 01යි)**
(ආ) ප්‍රවර්ධනය **(ලකුණු 01යි)**

(iv) 1. මිල දී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම.
2. ගත් මිලකට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයාගත හැකි වීම.
3. ඕනෑම අවස්ථාවක සමාන්‍ය කොටස් අලෙවි කර මුදල් ලබා ගැනිමට හැකි වීම.
4. ණය ලබා ගැනිමේ දී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කල හැකි වීම.
5. ඡන්දය භාවිතා කර අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ හැකියාව.
6. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම මඟින් සමාගමට සම්බන්ධ තීරණගැනීමට දායක විය හැකිවීම. **(1x2 = ලකුණු 02යි)**

05. (i) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම. **(ලකුණු 02යි)**

(ii) ප්‍රාග්ධන ගිණුම
ගැනිලි ගිණුම **(1x2 = ලකුණු 02යි)**

(iii) (අ) 1/2 අමතර ප්‍රාග්ධනය ලෙස රු.30,000 යෙදවිම/රු.30,000 ක ආදායමක් ලැබිම.
1/8 රු.10,000 ක් පිරිවැය වු භාණ්ඩ තොගයක් රු.15,000 කට ණයට විකිණීම.
1/20 රු.7,000ක් වටිනා භාණ්ඩ තොගයක් මුදලට ගැනිම.
1/22 අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට රු.2,000ක් වටිනා භාණ්ඩ රැගෙන යාම.
1/26 රු.10,000 ක වියදමක් දැරිම හෝ රු.10,000 ක මුදල් ගැනිලි කිරිම.
1/29 ව්‍යාපාරයේ ණය හිමියන්ට රු.10,000ක් ගෙවිම.
**(1/2x6 = ලකුණු 03යි)**

(ආ) රු.93,000කි. **(ලකුණු 01යි)**

(iv) **විකුණුම් ජ'නලය**

| දිනය | ඉ.අ. | ගැනුම්කරු | වටිනාකම | |
|---|---|---|---|---|
| 1/4 | 101 | චමුදිනි | 12 000 | (1/2) |
| 1/18 | 102 | තුෂානි | 18 000 | (1/2) |
| 1/24 | 103 | ආකර්ෂණි | 11 000 | (1/2) |
| 1/31 | | විකුණුම් ගිණුමට බැර කලා | 41 000 | (1/2) |

**චමුදිනි**

| | |
|---|---|
| (1/2) 01/04 විකුණුම් 12 000 | |

**තුෂානි**

| | |
|---|---|
| (1/2) 01/18 විකුණුම් 18 000 | |

**ආකර්ෂණි**

| | |
|---|---|
| (1/2) 01/24 විකුණුම් 11 000 | |

**විකුණුම් ගිණුම**

| | |
|---|---|
| | 01/31 ණයගැතියෝ 41 000 (1/2) |

06. (i) (අ) 1. වැරදි නිවැරදි කිරිමේ සටහන්
2. ගැලපුම් සටහන්
3. ජංගම නොවන වත්කම් ණයට ගැනිම
4. ජංගම නොවන වත්කම් ණයට විකිණීම
5. භාණ්ඩ ගැනිලි කිරිම

**(1/2x2 = ලකුණු 01යි)**

(ආ) 1. නිෂ්පාදන පිරිවැය
2. භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම
3. ආදේශන භාණ්ඩ වල මිල ගණන්
4. නීතිමය සාධක **(1/2x2 = ලකුණු 01යි)**

(ii) **පියුමාලිගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුම**

| විස්තරය | හර | බැර | |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 1,000,000 | }(1/2) | |
| ස්ථාවර තැන්පතු | 150,000 | | |
| විකුණුම් | (1/2){ | 400,000 | |
| ලද වට්ටම් | | 8,000 | |
| ණය ගැතියෝ | 30,000 | | }(1/2) |
| බැංකු ණය | | 30,000 | |
| ප්‍රාග්ධනය | | 742,000 | }(1/2) |
| | **118,0000** | **118,0000** | |

**(ලකුණු 02යි)**

(iii) **<u>ප්‍රාථමික පිරිවැය</u>**

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය - ලෑලි | 150,000 |
| සෘජු ශ්‍රමය - වඩු කාර්මික වැටුප | 100,000 |
| වෙනත් සෘජු -සෘජු වෙනත් වියදම් | 40,000 |
| | 290,000 |

**නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය**

| | |
|---|---|
| වක්‍ර ද්‍රව්‍ය - ඇණ සහ පොලිෂ් | 20,000 |
| වක්‍ර ශ්‍රමය - මුරකරු වැටුප් | 25,000 |
| වෙනත් වක්‍ර - යන්ත්‍ර ක්ෂය | 20,000 |
| විදුලිය | 30,000 |
| වෙනත් පොදු කාර්යය | 8,000 |
| | 103,000 |

(අ) මුළු නිෂ්පාදන පිරිවැය = 290,000 + 103,000
= 393,000 **(ලකුණු 02යි)**

(ආ) ඒකකයක පිරිවැය = $\frac{393,000}{10}$
= 39,300 **(ලකුණු 01යි)**

(ඇ) මුළු ලාභය = $\frac{393,000}{100} \times 20$
= 78,600 **(ලකුණු 01යි)**

(iv)

**සංශෝධිත බැංකු ගිණුම**

| | | | | | |
|---|---|---|---|---|---|
| (1/2) | ශේෂය | 52 000 | බැංකු ගාස්තු | 3 000 | (1/2) |
| (1/2) | ණයගැති ප්‍රේෂණ | 20 000 | | | |
| | | | ශේෂය ප/ගෙ | 69 000 | (1/2) |
| | | **72 000** | | **72 000** | |
| | ශේෂය ඉ/ගෙ | **69 000** | | | |

**(ලකුණු 02යි)**

**බැංකු සැසඳුම් ප්‍රකාශය**

| | | | | |
|---|---|---|---|---|
| | සංශෝධිත බැංකු ශේෂය | | 69 000 | (1/2) |
| + | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | 10 000 | 10 000 | (1/2) |
| | | | 79 000 | |
| (-) | තැන්පත් කල නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් | 18 000 | (18 000) | |
| | බැංකු ප්‍රකාශයට අනුව බැංකු ශේෂය (1/2) | | 61 000 | (1/2) |

**(ලකුණු 02යි)**

07. (i) (අ) 1. වත්කම්
2. වගකීම්
3. හිමිකම් (1/2x2 = **ලකුණු 01යි)**

(ආ) ලැබිය යුතු ආදායම් ගිණුම හර
අදාල ආදායම් ගිණුම බැර **(ලකුණු 01යි)**

(ii)

**ආදායම් ප්‍රකාශනය**

| | | | | |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| සාමාජික ගාස්තු | | 200 000 | 200 000 | (1/2) |
| (-) **වියදම්** | | | | |
| ක්‍රීඩා පිටිය නඩත්තු වියදම් | (1/2) | 30 000 | | |
| ක්‍රීඩා උපදේශක ගාස්තු | (1/2) | 60 000 | (90 000) | |
| අතිරික්තය | | | 110 000 | (1/2) |

**(ලකුණු 02යි)**

(iii) **ජලනිගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය.** (1/2)

| | | | | |
|---|---|---|---|---|
| | **විකුණුම්** | | | 250 000 |
| (-) | **විකුණුම් පිරිවැය** | | | |
| | ආරම්භක තොගය | | 40 000 | |
| + | ගැනුම් | | 150 000 | |
| | විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය | | 190 000 | |
| (-) | අවසන් තොගය | | (40 000) | (1/2) (1/2) |
| | විකුණුම් පිරිවැය | | | (150 000) |
| | දළ ලාභය | | | 100 000 (1/2) |
| + | **වෙනත් ආදායම්** | | | |
| | ලද වට්ටම් | | 4 000 | 4 000 |
| (-) | **බෙදා හැරීමේ වියදම්** | | | 104 000 |
| | බොල් ණය | 2 000 | | |
| | බෙදා හැරීමේ රථ ක්ෂය | 25 000 | (1/2) | |
| | දුන් වට්ටම් | 2 000 | | |
| | බෙදා හැරීමේ රථ නඩත්තු | 18 000 | 47 000 | |
| | **පරිපාලන වියදම්** | | | |
| | රක්ෂණ ගාස්තු | 15 000 | (1/2) | |
| | විදුලි ගාස්තු | 4 000 | | |
| | වැටුප් හා වේතන | 25 000 | 44 000 | |
| | **මූල්‍ය වියදම්** | | | |
| | බැංකු ණය පොලි | 15 000 | (1/2) 15 000 | (106 000) |
| | ශුද්ධ අලාභය | | (1/2) | **(2 000)** |

**(ලකුණු 04යි)**

**ජලනිගේ ව්‍යාපාරයේ** (1/2)

**2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** (1/2)

| *ජංගම නොවන වත්කම්* | *පිරිවැය* | *සමුච්චිත ක්ෂය* | *ධාරණ අගය* | |
|---|---|---|---|---|
| බෙදා හැරීමේ රථ | 250 000 | 55 000 | 195 000 | (1/2) |
| | | | 195 000 | |
| **ජංගම වත්කම්** | | | (1/2) | |
| අවසන් තොග | | 40 000 | (1/2) | |
| ණය ගැති | | 20 000 | | |
| මුදල් | | 60 000 | 120 000 | |
| | | | 315 000 | |
| ප්‍රාග්ධන | | 180 000 | | |
| (-)ශුද්ධ අලාභය | | (2 000) | (1/2) 178 000 | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| 15% බැංකු ණය | | 100 000 | 100 000 | |
| **ජංගම වගකීම්** | | | | |
| ණය හිමියෝ | | 30 000 | | |
| උපචිත රක්ෂණ ගාස්තු | | 2 000 | (1/2) | |
| උපචිත බැංකු ණය පොලි | | 5 000 | (1/2) 37 000 | |
| | | | 315 000 | |

**(ලකුණු 04යි)**